00174

(සියලුම හිමිකම් ඇවිරිණි)

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (1)

# අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය (03)

කාලය පැය 03 යි.

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
**සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.**

01 සාක්ෂි ආඥා පණතෙහි දී ඇති අර්ථ නිරූපණයන් සැලකිල්ලට ගෙන පහත සඳහන් දෑ ඉතා සැකෙවින් (වාක්‍යයකින් හෝ දෙකකින්) පැහැදිලි කරන්න.

අ) අධිකරණය ආ) කරුණ ඇ) ඉදිරිපත් කරුණ

ඈ) අනුකූල වීම ඉ) ලේඛණය ඊ) ඒත්තු ගැනීම

උ) වරද කියා පෑම ඌ) ප්‍රතිබන්ධනය එ) ඔප්පු නොවූ බව

ඒ) සත්‍ය බව ඔප්පු වූ බව

(ලකුණු 20)

02 දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ව ;

අ) "සොරකම" යන්න නිර්වචනය කරන්න. (ලකුණු 05)

ආ) "බලෙන් ලබා ගැනීම" යන්න නිර්වචනය කරන්න. (ලකුණු 05)

ඇ) සොරකම කොල්ලකෑමක් වන අවස්ථා සහ බලෙන් ලබා ගැනීම කොල්ලකෑමක් වන අවස්ථාවන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

03 අ) සිරිසේන තම අසල්වැසි දයාසේනගේ නිවස ඉදිරියට පැමිණ දයාසේනගේ භාර්‍යාවගේ චරිතයට ද හානි වන අයුරෙන් දයාසේනට ආක්‍රෝෂ පරිභව කරමින් ඔහු ප්‍රකෝප කෙරෙන අන්දමින් හැසුරුනේ ය. සිරිසේන කෙරෙහි දැඩි කෝපයකින් වෙළී ගිය දයාසේන ඕනෑකමින් ම සිරිසේනගේ අවුරුදු 08 ක් වයසැති පුතා ඇද පිහියෙන් ඇන මරා දැමී ය. දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ව දයාසේන ගේ අපරාධ වගකීම පරීක්ෂා කරන්න. (ලකුණු 10)

ආ) ජගත් මග රැක සිට විජිත්ට බැන වදිමින් පහර දුන්නේ ය. මේ පහර දීම නිසා විජිත්ට දරුණු ප්‍රකෝපයක් හට ගනී. ජගත් සමග අමනාපයෙන් පසු වූ සුගත් මේ අවස්ථාවේ දී විජිත් තුළ ඇති වූ ප්‍රකෝපයෙන් ප්‍රයෝජන ගෙන ජගත් මැරවීමේ අදහසින් එම කාර්යය කරවීම සඳහා විජිත්ගේ අතට පිහියක් දුන්නේ ය. විජිත් එම පිහියෙන් ඇන ජගත් මරා දමයි. විජිත්ගේ සහ සුගත්ගේ අපරාධ වගකීම පරීක්ෂා කරන්න. (ලකුණු 10)

04 දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන අනුව;

අ) "ව්‍යාභිචාරී වරද" සිදු කරනු ලබන්නේ යයි සැළකෙන්නේ කවර අවස්ථාවන්හි දී ද ? (ලකුණු 10)

ආ) ව්‍යාභිචාරී වරද දණ්ඩ නීති සංග්‍රහයට හඳුන්වා දෙනු ලැබුවේ කවර සංශෝධන පනතෙන් ද?(සංශෝධන පනතේ වර්ෂය සහ අංකය සමග ලියන්න.) (ලකුණු 05)

ඇ) ව්‍යාභිචාරී වරදට වැරදි කරු වන තැනැත්තෙකුට පැනවිය යුතු දඬුවම කවරේද? (ලකුණු 05)

00174

05 ආ) දණ්ඩ නීති සංග්‍රහයේ පුද්ගල ආරක්ෂාවේ අයිතිය පිළිබඳව ඇති විධිවිධාන නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ආ) පුද්ගලික ආරක්ෂාවේ අයිතිය නොමැති ක්‍රියාවන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

06 අ) ධයස් විසින් ආසිරි වෙත ලියනු ලැබූ රු. 50,000/- ක් වටිනා ණය පත්‍රයක් ආසිරි ළඟ ඇත. ආසිරි තම ගනුදෙනු කරුවකු වන කසුන්ට වංචාවක් සිදු කිරීමේ අදහසින්, ධයස් විසින් එකී ණය පත්‍රයෙහි ලියන ලද දෙයක් ලෙස කසුන් ලවා විශ්වාස කරවීමේ අදහසින් එකී ණය පත්‍රයෙහි සඳහන් මුදලේ මුලට අංක 1 එකතු කිරීමෙන් රු.150,000/- බවට පත් කරයි. දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ව ධයස් ගේ සහ ආසිරි ගේ අපරාධ වගකීම පරීක්ෂා කරන්න.

(ලකුණු 10)

ආ) සුනිල් 2013 මාර්තු මස 20 වන දින පෙරවරු 10.30 ට විමල්ට පහර දුන්නේය යන චෝදනාව මත සුනිල්ට විරුද්ධ ව අධිකරණයේ නඩුවක් විභාග වෙයි. ජාතික මූල්‍ය බැංකුවේ මරදාන ශාඛාවේ සේවය කරන කමල් අධිකරණයේ දී දිවුරුම් දී සාක්ෂි දෙමින් පහර දුන්නේ යයි කියන දිනයේ පෙරවරු 10.00 සිට පෙරවරු 11.00 දක්වා කාලය තුළ තම බැංකුවේ කවුන්ටරයේ මුදල් තැන්පත් කිරීමක් සඳහා සුනිල් පැමිණ සිටි බව එසේ පැමිණ නොතිබිය දී කියා සිටියි. දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ව කමල් විසින් සිදු කරන ලද වරදේ ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 10)

07 නඩු විභාගයක දී සාක්ෂි විමසීම සිදු කිරීමේ දී සාක්ෂි විමසනු ලබන පිළිවෙල පැහැදිලි කරන්න.

(ලකුණු 20)

08 අ) කිෂාන් 2002.12.19 දින උපත ලැබූ පාසැල් යන පිරිමි ළමයෙකි. ඔහු විසින් දූෂානි නමැති තරුණියකට ස්ත්‍රී දූෂණයක් සිදු කරන ලද බවට ඔප්පු කළ හැකි දැයි සාක්ෂි ආඥා පනතේ විධිවිධාන අනුව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) ඕස්ට්‍රේලියාවේ ස්මිත්සෝන් ටයර් සමාගම ශ්‍රී ලංකාවේ සක්විති රබර් අපනයන සමාගමෙන් ස්වභාවික රබර් කාලයක් තිස්සේ මිළට ගනී. ස්මිත්සෝන් සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ ඉයන් ස්මිත් විසින් එවන ලද ලිපියක ඇති අත් අකුරු ඔහුගේ ම ද යන්න ඔප්පු කරගැනීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත. සක්විති රබර් සමාගමේ අලෙවි කළමනාකරු පී. කාරියවසම් ස්මිත්සෝන් සමාගමේ ඉයන් ස්මිත් සමග අත් අකුරින් ලියූ ලිපි බොහෝ කලක් හුවමාරු කරගෙන ඇත. කාරියවසම් මහතාගේ ලිපිකරුවකු වන ජයන්තගේ කාර්යය වී තිබුනේ ඉයන් ස්මිත් එවන ලිපි පරීක්ෂා කොට ගොනු කිරීම ය. සැම්සන් නමැත්තා කාරියවසම් ගේ බ්‍රෝකර් වරයෙකි. ඉයන් ස්මිත් එවන ලද බොහෝ ලිපි යම් යම් උපදෙස් ලබාගැනීම සඳහා කාරියවසම් විසින් සැම්සන්ට නිතර ඉදිරිපත් කරනු ලැබ ඇත. කාරියවසම් හෝ ජයන්ත හෝ සැම්සන් කිසිදිනෙක ඉයන් ස්මිත් ලිපි ලියනවා දැක නැත. ඉහත සඳහන් කරන ලද ලිපියේ ඇත්තේ ඉයන් ස්මිත් ගේ අත්අකුරු ම දැයි නිගමනය කිරීමේ ප්‍රශ්නයේ දී කාරියවසම්, ජයන්ත සහ සැම්සන් යන අය දරන මතයන් නඩුවක සාක්ෂි වශයෙන් අනුකූල වන්නේ ද යන්න සාක්ෂි ආඥා පනතේ විධිවිධාන අනුව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**************